ළමා නාට්‍යකරණය යුගයේ අවශ්‍යතාවක් වන්නේද?

උපතේ සිටම දරුවාගේ ලෝකය පෝෂණය වන්නේ වැඩිහිටියන් ගෙන් ලබන්නා වූ අත්දැකීම් මත බව පිළිගත් සාධකයකි. නාට්‍ය කලාව තුළ අන්තර්ගත වන මූලධර්මයක් වන අනුකරණය මෙහිදී ඉතා ප්‍රබල වන්නේය.

ළමයා යන නාමය ඇසූ පමණින් අප තුළ විශේෂවෙයක් හට ගනියි. එනම් රැක බලා ගත යුතු, රැකවරණය දිය යුතු, ආදරය කළ යුතු, මත පෙනේවිය යුතු ආදී නොයෙක් ආකාරයේ හැකිමි සමුදායකින් පිරිවරාණකි.

නිරෝගී ශරීර සෞඛ්‍යයකින් හෙබි වර්ධනයක් අපේක්ෂාවෙන් තම දරුවාට පෝෂදායී ආහාර ලබා දීමට දෙමාපියන් උත්සාහ දරති. 'දරුවාගේ මොළය වර්ධනයට මේ මාළු වර්ගය හොඳයි, ශරීරයට මේ පළතුර ගුණයි ' ආදී වශයෙන් පවසමින් සුවිශේෂ ආහාර පාන සොයා ගැනීමට වෙහෙසෙති. ඇතැම් වැඩිහිටියන් කුඩා දරුවාට සෙල්ලම් බඩුවක් දීමේදී තුවක්කුවක් හෝ කඩු, දුනු හී ආදී අවි ආයුධ ලබා දීම තරයේ ප්‍රතික්ෂේප කරති. රූපවාහිනී වැඩ සටහන් නැරඹීමේදී ත්‍රාසජනක සිදුවීම් සහිත රූපරාමු දරුවාගේ ඇස් නොගැටීමට වග බලා ගනිති.

මේ සියළු ප්‍රයත්නයන් කුමක් නිසාද? දරුවාගේ ශාරීරිකව මෙන්ම මානසිකවද යහපත් වර්ධනයක් අපේක්ෂා කරන නිසාවෙනි.

තම දරුවා ගැන මෙතරම් සැලකිලිමත් වන ඔබ, ළමා නාට්‍ය නම් මාධ්‍යය මේ යහපත් වර්ධනයට කෙතරම් ප්‍රබල ලෙස උපකාරී කොට ගත හැකිදැයි දැන සිටිමද්ද? නැසතාත් මේ ප්‍රබල වූ මාධ්‍යයට තම දරුවා යොමු කිරීමට අංශමාත්‍රික අදහසක්, ආශාවක් තිබුණේද?

ළමා නාට්‍ය නම් මාධ්‍යය ගැන සනිටුහන් කිරීමට ප්‍රථමව එය සමාජයීය අවශ්‍යතාවයක් බවට පත්වූ අයුරු සරලව සනිටුහන් කරමු.

අත්දැකීම

අත්දැකීම වූ කලි ඉගෙනුමට බලපාන්නා වූ ප්‍රධාන සාධකයක් බව විද්වතුන්, මනෝ විද්‍යාඥයන් නොයෙක් ආකාරයෙන් පෙන්වා දී අතර. කෙනෙක් කියූ, අසූ දෙයකින් ලබන්නා වූ ඉගෙනුමට වඩා තම අත්දැකීමෙන් ලබන්නා වූ ඉගෙනුම ඉතා ප්‍රබල වන්නේය. ගින්දරට පිච්චීමට බව දරුවාට උගන්වන්නේය. කොතරම් පොත පතින් ඉගැන්වුවද තමා විසින් අත පුච්චා ගැනීමෙන් ලබන අත්දැකීම තරම් ප්‍රබල වටහා ගැනීමක්

කෙසේ නමුත් වැඩමුළුවට සයසයක් පුරවන වන මොහොතේ තත්ත්වය ඉතාමත් වෙනස් තලයක වීය. දෙමාපියන් අතුරින් වැඩි දෙනා මේජ කරවමින් ළමුන් කණ්ඩායමේ වැඩි පිරිසක් සිංහල කතාබස් කිරීමටත් නිසි උච්චාරණයටත් සමත්කම් පෙන්වීය.

නොවන්නේය.

උපතේ සිටම දරුවාගේ ලෝකය පෝෂණය වන්නේ වැඩිහිටියන් ගෙන් ලබන්නා වූ අත්දැකීම් මත බව පිළිගත් සාධකයකි. නාට්‍ය කලාව තුළ අන්තර්ගත වන මූලධර්මයක් වන අනුකරණය මෙහිදී ඉතා ප්‍රබල වන්නේය.

ඇවිදීම, කතාබස් කිරීම, හිඳ ගැනීම ආදිය දරුවා තුරුවනුයේ වැඩිහිටියන් අනුකරණය කිරීමෙනි. ඔවුනටම තුරු වූ ආරුත් සුන් ශබ්ද වලින් සන්නිවේදනය අරඹන දරුවා විෂයයන් අතිහවා කැපී පෙනෙන විෂයයක් බවට පත් විය. එනම් නාට්‍ය කලාවේ ඇති මනෝ විද්‍යාත්මක පදනම හේතුවෙනි.

ශිෂ්‍යාචාරය ආරම්භයේ සිට 20 වන සියවස දක්වා ළමයා ගැන තිබූ ආකල්පය වූයේ වැඩිහිටියෙකුගේ කුඳු රූපයක් බවය. එහෙත්, සියවසක කාල පරාසයක් තුළ ඉතත ආකල්පයන් මහා පරිමාණිකව වෙනසට බඳුන් විය. ළමා පිළිබඳව අධ්‍යයනයන් වැඩි වශයෙන් සිදුවිය.ඊළඟයා වූ කලිඉහලුව විශේෂිත වූ ශාරීරික හා මානසික වර්ධනයකින් සහ හැකිමි වර්ධනයකින් හෙබි අයෙක් බව අධ්‍යයනයන්ගෙන් පුකට විය. - ළමයාගේ ශතවර්ෂය" සේ සැලකනු ලැබූ 20 වැනි සියවස තුළ ළමා මනෝවිද්‍යාව, ළමා සෞඛ්‍යය, ළමා අධ්‍යාපනය ආදී ළමයා සම්බන්ධිත බොහෝ ක්ෂේත්‍රයන් කෙරෙහි විද්වතුන්ගේ අවධානයත්, අධ්‍යයනයත් යොමුවිය. ළමයාගේ අවශ්‍යතා, ළමයාගේ ප්‍රශ්ණ අවබෝධ කොට ගැනීමට උනන්දු විය. මේ සියළු අධ්‍යයනයන් අතුරෙහි ළමයාගේ සමබර පෞරාණික නැංවීමට බලපාන්නා වූ සාධක වලින් පිරිපුන් විද්‍යාවක් ලෙස 'සෞන්දර්යය විද්‍යාව' රියේව අධ්‍යාපන ක්ෂේත්‍රයේ මුදුන් පෙත්තෙහි පිළිගැස්ස නිත. ඒ තුළිනුත් නාට්‍ය කලාව, අනෙකුත් සෞන්දර්යය

රටවල සිදුවන්නකි. නිර්මාණශීලී නාට්‍යකරණය ඉතා ප්‍රබල අධ්‍යාපනික මෙවලමක් බවට පත්වී තමාරය. පොත පතින් හෝ අසා දැන ගැනීමේ ගින්දර දැවෙන සුළු භාවය ඔබට ලබන දැනුමට වඩා තම අත පිච්චීමෙන් ලැබෙන දැනුම සදකාලිකය. එසේම නාට්‍යාකාරයෙන් ගින්දර දැවෙන සුළු භාවය දැකීම පොත පතින් හෝ අසා දැන ගැනීමෙන් රැඳෙන රූපයට වඩා අතිශය ප්‍රබල වන්නේය. එය දෙවැනි වූයේ තම අත පුච්චා ගැනීමෙන් ලබන අත්දැකීමට පමණක් වනු අතර. ස්‍රුප්‍රසිද්ධ අධ්‍යාපන මනෝ විද්‍යාඥයකු වූ 'එඩිනා ' මිංටන, පොත් ගණනාවකින් ලබන ඉගෙනුමට වඩා සමබර ඉගෙනුමක් නාට්‍යකාරා අත්දැකීමකින් ලබා ගත හැකි බවට පෙන්වා දී අතර.

මෙවන් සාධක මූලධර්ම, පිළිගැනීම් මොහොත් අයුරින් පොත පතට ඉතිහාසයට එකවී ඇත්තේය. කෙසේවෙතත් මේ මූලධර්මයන්ගේ ප්‍රායෝගිකතාවය අපි අත් විත්දෙමු. අපි දෙදෙන අත් විදි දෑ අතුරින් එක් නිදසුනක් මෙහි කියා පාන්නෙමු.

වසර 2002 මැයි මාසයේ නවසීලන්තයේ වෙලින්ටන් නුවර අප විසින් ළමුන් දෙදෙනා නාට්‍ය වැඩමුළුවක් අරඹුවෙමු. ඊට සහභාගිවූ ළමුන් අතුරින් සියයට අනූපහක් නවසීලන්තය හෝ වෙනත් බටහිර රටවල උපත ලද, සිංහල පරිසරයේ ආභාසය ඉතා අල්ප වූ, ඉංග්‍රීසි කතාබහට හුරු පුරුදු වූ පිරිසක් විය. ඉංග්‍රීසි ජාතිකයකු සිංහල වචන උච්චාරණයට දරන තැතට නොදෙවෙනි තැතක් දරමින් වචන උච්චාරණයට උත්සාහ ගත්, සුළු වූ වාග් මාලාවකින් සමන්විත වූත් ළමුන් පිරිසක් ලෙස හැඳින්විම නිසැරදිය. ඉන් බොහෝමයක් දෙනා වසර ගණනක් සිංහල භාෂා පංති සඳහාද සහභාගී වන සිසුන් විය. නාට්‍ය වැඩමුළුව ආරම්භ දින අප කතාබස් කළ දෑ ඔවුන්ටද, ඔවුන් කතාබස් කළ දෑ අපටද තේරුම් ගැරීමට පහසු වූයේ යැයි කීම සත්‍ය නොවනු ඇත. කෙසේ නමුත් වැඩමුළුවට සයසයක් පූර්ණ වන මොහොතේ තත්ත්වය ඉතාමත් වෙනස් තලයක විය. දෙමාපියන් අතුරින් වැඩි දෙනා මේජ කරවමින් ළමුන් කණ්ඩායමේ වැඩි පිරිසක් සිංහල කතාබස් කිරීමටත් නිසි උච්චාරණයටත් සමත්කම පෙන්විය. වසර ගණනක් පන්ති කාමරයක ඉගැන්වීමට වඩා සයසයක නාට්‍ය වැඩමුළුවට ඔවුන්ගේ භාෂා ඥානය පුළුල් කිරීමට ප්‍රබල විය. නිර්මාණශීලී නාට්‍ය මාධ්‍යය හේතුවෙන් දරුවන් ලැබූ වෙනස සැමටම ප්‍රත්‍යක්ෂ වූ වෙනසක් විය.

ළමා නාට්‍ය නිෂ්පාදනය

මූලධර්මයන් මත නිර්මාණය කෙරෙන හොඳ නාට්‍ය කෘතියකින් නිර්දෙශයත්, පිරිවාරබෝධයත්, ලෝකාවබෝධයත්, චිත්ත වර්ධනයත් ලබන බව අපි දනිමු. විවිධ වූ තලයන් තෙන් හෙබි විවිධ වූ ප්‍රේක්ෂකයන් මේ චින්තනය, ලෝකාවබෝධය ලබන ආකාරය විවිධ වනු ඇත. මේ විවිධත්වය මත පිහිටා ළමුන්ගේ ශාරීරික, මානසික වර්ධනයට උචිත ආකාරයේ නාට්‍ය නිර්මාණය කිරීමේදී ළමා නාට්‍ය බිහි වනු ඇත.

විසි වැනි සියවසේදී ළමයාට ගැලපෙන නාට්‍ය නිර්මාණය කිරීමට විද්වතුන්ගේ අවධානය යොමු විය. දියුණු රටවල අධ්‍යාපනඥයින්, මනෝ විද්‍යාඥයන් සහ නාට්‍ය කලාකරුවන් නොයෙක් පර්යේෂණ හා අත්හද බැලීම් සිදු කරනු ලැබිය. ළමයින් වෙනුවෙන් රඟ දක්වන නාට්‍ය හෝ ළමුන් විසින් රඟ දක්වන නාට්‍ය ඔවුන්ගේ වයස් සීමාවන්ට සරිලන ආකාරයෙන් කෙසේ නිර්මාණය කළ යුතුද යන අත්හද බැලීම සහ පර්යේෂණයන්ට අනුකූලව ළමා නාට්‍ය වර්ගීකරණයන් කිපයකට ලක්විය.

1. ළමයින් සඳහා ප්‍රවීණයන් රගපාන නාට්‍ය
2. ළමයින් හා ප්‍රවීණයන් එක්වී රගන නාට්‍ය
3. ළමයින් විසින් රගන නාට්‍ය
4. අධ්‍යාපනය සඳහා නාට්‍ය

මේ වර්ගීකරණයන් ගෙන් කිපයකි. මේ වර්ගීකරණයන් අනු මාර්ගික ඔස්සේ වැඩිදුර කතාබස් කිරීමෙන්, විදෙස් රටවල වෙසෙන ශ්‍රී ලාංකික ජන සමාජයක් වශයෙන් ළමා නාට්‍ය මාධ්‍ය අපට ප්‍රබලව හාවිතා කළ හැකි අයුරු සාකච්ඡාවට බඳුන් කිරීමෙන් මිළඟ කලාපයේ කරළියෙන් හමුවෙමු.

කුසුම්සිරි සහ යශෝධරා

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් ඕදුරු සංගීතය

සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

ඔබේ හඬ - ලක් හඬ